● නයනජීව බණ්ඩාර

ආර්ථික පීඩනයෙන් මොනරාගල වතුකරය පවුල් හාරදහසක් අනතුරේ!

වර්තමානයේ රට මුහුණ දී ඇති ආර්ථික අර්බුදය සමාජයේ බොහෝ ස්ථර කෙරෙහි බලපෑම් එල්ල කර ඇතත්, ඒ හමුවේ වඩාත් පීඩනයට පත්ව ඇත්තේ, විවිධ හේතු මත ආන්තිකරණයට ලක්ව සිටින ප්‍රජාවන්ය. කඳුරට වතු කම්කරු ප්‍රජාව, ඒ පිළිබඳව සිහියට නැගෙන එක් ප්‍රබල නිදර්ශනයකි. එසේ වුවද, එම ප්‍රජාවගෙන්ම බිඳී ගොස් පහතරට කුඩා පරිමාණ වතු ආශ්‍රිතව විසිර සිටින කම්කරු ප්‍රජාව ගැන කිසිවකුගේ අවධානයට ලක්වන්නේ නැත. ඔව්, ඒ නිසාම ඔවුන්ගේ කතාව වඩාත් බරපතළය. සමහරවිට මෙය, ඒ ගැන ජනමාධ්‍යයක පුළුල් අවධානයක් යොමු වන පළමු අවස්ථාව විය හැකිය.

විසි හය හැවිරිදි වේලු අම්බිගා අපට හමුවන්නේ, මීට කලකට පෙර අතහැර දැමුණු වතුයායක් වූ මොනරාගල අලියාවත්ත ගම්මානයේදීය. සිවුදරු මවක වන ඇය කෙරෙන් පළ වන්නේ, වයසට වඩා වියපත් පෙනුමකි. බැලූ බැල්මට ඇස ගැටෙන්නේ දරිද්‍රතාව ...

... සිංහල ජනයාද, සියයට 0.8ක් මුස්ලිම් ජනයාද වේ. සියයට එකක් පමණ වෙනත් ජනවර්ගවලට අයත්ය.

වත්තත් නැහැ, ගමත් නැහැ

"මොනරාගල දිස්ත්‍රික්කයේ වතු වගාව ආරම්භ වුණේ ...

උසස් පෙළට ගියේ තුන්දෙනයි

පවුල් හාරදහසක් අවදානමේ



කෝටි 15කට ආසන්න EPF/ ETF, පාරිතෝෂිත වතු කම්කරුවන්ට ගෙවා නෑ

... කරන නිදර්ශනයකි.

ජේපාලන් අයිරිෂ්ගේ උප්පැන්නයේත්, ජාතික හැඳුනුම්පතේත්, විවාහ සහතිකයේත්, ඡන්ද නාමලේඛනයේ මෙන්ම ඇය සේවය කරන කුමාරවත්ත වතුයායේ වැටුප් ලේඛනයේත් ඇයගේ නම ලෙස සඳහන්ව ඇත්තේ 'ජේ. අයිෂේ' ලෙසය. තමන්ගේ නම, උප්පැන්න ...

මව්වරුන් විදේශගත වෙලා

"මේ තියෙන ආර්ථික පීඩනය විශේෂයෙන් අපේ වතු කාන්තාවන්ට දරාගන්න බැහැ. පහුගිය මාස දෙක, තුන තුළ අපේ වත්තේ ඉන්න වතු කාන්තාවන්ගෙන් සැලකිය යුතු පිරිසක් විතර තමන්ගේ අත දරුවන් පවා අතහැරලා මැදපෙරදිග ගෘහ සේවයට ගිහින් තියෙනවා. ඒ අය මේක කැමැත්තෙන් කරන දෙයක් නෙමෙයි. කරන්න වෙන කිසිම දෙයක් නැති නිසයි මේ තත්ත්වයට පෙලඹිලා තියෙන්නේ. වතු කාන්තාවන් මේ විදිහට විදේශගත වීම නිසා ඒ පවුල් තුළ තවත් අතුරු ප්‍රශ්න ගොඩක් ඇතිවෙලා තියෙනවා. නමුත් ඒ අයට වෙන විකල්පයක් නැහැ." බඩල්කුඹුර ගමේවෙල වතු යායේ පදිංචි සමාජ ක්‍රියාකාරිනියකද වන **ආර්. ඩී. දිල්රුක්ෂි** මෙනවිය පෙන්වා දෙන්නීය.

ඉංග්‍රීසි ජාතිකයන් විසින් ආරම්භ කළ මොනරාගල දිස්ත්‍රිකයේ වතු වගාවට කණ කොකා හඬන්න ගත්තේ 1974 ...

... වගේම පාරිතෝෂික මුදල් ගෙවන්නේ නැහැ. EPF/ ETF විතරක් රුපියල් කෝටි 05කට ආසන්න ගණනක් සේවකයන්ට ගෙවන්න තියෙනවා. තමන් ජීවිත කාලයක් වත්තට කඹුරලා උපයගත්ත මුදල ලබාගන්නත්, මේ වතු සේවකයන්ට නඩු කියන්න වෙලා තියෙනවා. මේක හරිම අවාසනාවක්."

බඩල්කුඹුර, වෙයිකුඹුර වතුයායේදී අපට හමු වූ **ආර්. රාජේෂ්වරී** (47) මෙසේ පැවසුවේය.

"අපේ වත්තේ පවුල් 60ක් විතර ඉන්නවා. එයාලා මේ කාලය ගතකරන්නේ ඉතාම අසීරුවෙන්. විශේෂයෙන් දරුවන්ට හොඳ පෝෂ්‍යදායී කෑම වේලක් සපයා දීම අපේ කාන්තාවන්ට මේ කාලයේ හීනයක්. ගොඩක් දෙනෙක් තමන් කන කෑම වේල් ගණන අඩුකරලා තියෙනවා. උදේ කහට කෝප්පයක් බීලා වැඩට යන අය නැවත කෑමක් සපයගන්නේ රෑට. ඒ ගන්න කෑමෙත් බොහෝ විට තියෙන්නේ බතකුයි, එක එළවළුවකුයි විතරයි. රුපියල් ...

වත්ත නිසා සහනාධාර නෑ

දේපාලනයන්ගේ වතු කොල්ලය

ක්ෂුද්‍ර ණය මර උගුල

ලෝක ආධාරත් ඇති නැහැමය

විසිරී ගොස් ... එම්.එච්.එන්. ...

අනතුරුවලුත් අතහැරෙ ගිහින්

දුප්පත් අයට තමයි දුන්නේ

කවුරුත් අපිව අත්හැරලා!

අද CARTOON



බ්‍රිතාන්‍ය කාන්තාවක් සිය හදවත බැලීමට කෞතුකාගාරයට යයි

● වසර 16කට පෙර සිදුකළ සැත්කමකින් ඇගේ හදවත ඉවත් කර ප්‍රදර්ශනයට තබලා

● "අද මම සතුටින්, ක්‍රියාකාරීව ඉන්නේ මට හදවතක් දුන්න ඒ දායකයා නිසයි" - ජෙනිෆර් සටොන්

බ්‍රිතාන්‍යයේ හෙම්ස්ෆයර්හි, රින්ග්වුඩ් නගරයේ වෙසෙන 38 හැවිරිදි කාන්තාවක් පසුගියදා ලන්ඩන් නුවර පිහිටි හන්ටේරියන් කෞතුකාගාරයට ගියේ එහි ප්‍රදර්ශනයට තබා ඇති සිය හදවත නැරඹීමේ අපේක්ෂාවෙනි.

ජෙනිෆර් සටොන් නමැති මෙම කාන්තාව සම්බන්ධයෙන් දැනට වසර 16කට පෙරාතුව සිදුකළ සැත්කමකදී ඇගේ හදවත ඇගේ සිරුරෙන් ඉවත්කර ඒ වෙනුවට වෙනත් හදවතක් බද්ධ කෙරුණු අතර, පසුව ඇගේ හදවත මෙලෙස එම කෞතුකාගාරයේ ප්‍රදර්ශනයට තැබීම සිදුවිය.

● සාකල්‍යා සඳමාලි

වඳවී යන තඹලයා රැකගැනීමේ ව්‍යාපෘතියක්

අදට (22දා) යෙදෙන ලෝක ජෛව විවිධත්ව දිනය වෙනුවෙන් ලංකාවට ආවේණික, වඳවී යෑමේ තර්ජනයට ලක්ව ඇති දැනට වියළි කලාපයේ මල්වතු ඔය සහ තදාසන්න ප්‍රදේශවලට පමණක් සීමාවූ, මිරිදිය මත්ස්‍යයකු වන තඹලයා/තඹලවැන්නා හෙවත් ගල්කටුවා මත්ස්‍යාගාර තුළ අභිජනනය කර පැටවුන් අනුරාධපුර තුම්බිකුලම වැවට මුදාහැරීමට නියමිතව තිබේ.

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය සහ ජාතික ජලජීවී වගා සංවර්ධන ආයතනය මූලිකත්වයෙන් සිදු කළ පර්යේෂණයක ප්‍රතිඵලයක් ...

... මහතාද, ඒ.ආර්. මුදලිගේ මහතා, ආචාර්ය සඳුන් පෙරේරා සහ මහාචාර්ය ඒ.ආර්.එස්. බී. අතාවුද මහතාද කටයුතු තරන අතර

මෙලෙස වඳවී යන මසුන් අභිජනනය මගින් සංරක්ෂණය කිරීම සඳහා තවත් පර්යේෂණ සිදුකරමින් සිටී. මෙම කටයුත්ත සඳහා සඳහා සබරගමුව විශ්වවිද්‍යාලය, ජලජීවී වගා සංවර්ධන අධිකාරිය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, සොබාදහම ...

managing together ව්‍යාපෘතිය, වනජීවී දෙපාර්තුමේන්තුව, healthy landscape ව්‍යාපෘතිය ඇතුළු ආයතන රාශියක් දායකත්වය ලබා දේ.

ලංකාවේ මිරිදිය මසුන් අතරින් සුවිශේෂ වූ මත්ස්‍ය විශේෂයක් ලෙස තඹලයා/තඹලවැන්නා හෙවත් ගල්කටුවා හඳුන්වාදිය හැක. දැනට, ශාක සහ සත්ව ආරක්ෂණ පනත මගින් (FFPO) ආරක්ෂිත මත්ස්‍යයෙකු ලෙස නම් කර ඇති, අතීතයේ ලංකාවේ බොහෝ ප්‍රදේශවල විශාල වශයෙන් ව්‍යාප්ත වී සිටි, එහෙත් විද්‍යාත්මක ගවේෂණයකට අනුව 1990 දශකය වනවිට ලංකාවෙන් වඳවී ගියා යැයි සැලකෙන තරමට ස්වාභාවික ගහනය විශාල ලෙස අඩු වූ මත්ස්‍යයෙකි තඹලයා. දළවශයෙන් සෙ. මී. 30 පමණ දිග සහ ...

2015 සිට මෙරට පාසල් 200ට ආසන්න සංඛ්‍යාවක් වැසී ගිහින්

වැසීගිය පාසල්

බස්නාහිර පළාතේ තත්ත්වය

පාසල් වැසීයාමට හේතු

ඉංගලමුව පාසල් ගොඩැලි දරුවන්